TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපළ සුරැකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1, එලිබෑන්ක් පාර,
කොළඹ 05.
2019.11.02.

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි,

**<u>දේශපාලන පක්ෂයක් සහ ජනාධිපතිවරණ අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන අයුරින් රාජ්‍ය මුදල් භාවිතා වීමක් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා</u>**

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට ලැබී ඇති පැමිණිල්ලකට අනුව 2019.10.01 වන දින දිනමිණ පුවත්පතේ 'වැඩිහිටියෝ' අතිරේකය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා වෙන් කර තිබිණි. එම අතිරේකය පළකිරීම සඳහා වැය වූ මුදල අදාළ අමාත්‍යාංශය විසින් දරා ඇති බවට වාර්තා විය.එයට අදාළ ඡායා පිටපත් මේ සමග අමුණා ඇත.

මෙලෙස රාජ්‍ය ආයතන හා රාජ්‍ය මුදල් ජනාධිපතිවරණයට සම්බන්ධ පක්ෂයක් ප්‍රවර්ධනය වන ආකාරයට යොදා ගැනීම තුලින් එක් ජනාධිපතිවරණ අපේක්ෂයෙක් ප්‍රවර්ධනය වන බැවින් ඒ සඳහා අවශ්‍ය නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා බස්නාහිර පළාත් සම්බන්ධීකාරක සංඛී අමා මෙනවිය හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතාගේ 076 322 344 2/076 322 366 2 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ව්‍යාපාරයේ ස්වාධීන දේශීය ශාඛාවයි.පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේදී පොදු දේපල අවභාවිතා වීම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තුතියි.

මෙයට,

විශ්වාසී.

................................
ලක්විජය බණ්ඩාර.
ජාතික සම්බන්ධීකාරක. (PPPR)

# වැඩිහිටියෝ

වර්ෂ 2019 ක් වූ ඔක්තෝබර් මස 01 වැනිදා අඟහරුවාදා





## "The Journey to Equality"

## "වැඩිහිටි ඔබට නිසි තැනක් දෙන හෙට දවස"

වැඩිහිටි සැනසීමක් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய சபை மற்றும் தேசிய செயலகம்
National Council and Secretariat for Elders

**ජාත්‍යන්තර වැඩිහිටි දිනය අදයි**

# ප්‍රාදේශීය මට්ටමෙන් වැඩිහිටි වෛද්‍ය සායන

[illegible]

## වැඩිහිටි දිනය අනුරාධපුරයේ දී

ලක්මාල් දිසානායක

ඔක්තෝබර් මස 01 වැනි දිනට යෙදෙන ජාත්‍යන්තර වැඩිහිටි දිනය වෙනුවෙන්, ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය හා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය එක් ව සංවිධානය කරනු ලබන ජාතික වැඩිහිටි සැමරුම් උත්සවය අද (01) දින අනුරාධපුර සල්ගාදු ක්‍රීඩාංගණයේ දී අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් හා ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍ය දයා ගමගේ මහතා ඇතුළු මැති ඇමැතිවරුන්ගේ හා වැඩිහිටියන් 5000ක ගේ සහභාගීත්වයෙන් පැවැත් වේ. මෙහි දී ශ්‍රී ලංකාවේ වයස්ගත ම මව හා පියා "අභිසර ප්‍රණාම" සම්මානයෙන් හා වැඩි ම දරුවන් බිහි කළ මව " අභිමන් ප්‍රණාම" සම්මානයෙන් පිදුම් ලැබීමට නියමිත ය. එසේ ම ජාත්‍යන්තර වැඩිහිටි දින උත්සවය වෙනුවෙන් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය සංවිධානය කරන ලද සියලු තරගයන්හි ත්‍යාග ප්‍රදානයන් ද මෙහි දී සිදු කෙරේ.

## කතරගම වැඩිහිටි නිවාසය ඇමැතිතුමාගේ නිරීක්ෂණයට





මධුෂා ගමගේ

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය සතු වැඩිහිටි නිවාස ද්විත්වයෙන් එකක් වන කතරගම පිහිටි රජයේ වැඩිහිටි නිවාසය ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය දයා ගමගේ මහතාගේ නිරීක්ෂණයට ලක් විය. එසේ ම මේ වැඩිහිටි නිවාසය ඉදිකිරීම වෙනුවෙන් වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලින් රු. බිලියන 250ක් වෙන් කිරීමට ද පියවර ගන්නා ලදි. අපනයන අඹ ගම්මාන 5000ක් පිහිටුවීමේ වැඩසහනින් කතරගම දෙවුපුරවැසි අඹ අපනයන ගම්මාන පිහිටුවීමට අඹ පැළ 10,000ක් බෙදදෙන ලදී.

ප්‍රවෘත්තියක් ලෙස අන්තර්ජාලයට www.dinamina.lk/elders වෙත පිවිසෙන්න

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ මෙහෙයවීමෙනි